# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 49 දරන
# දුම්රිය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


1983 දෙසැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිළ : ශත 45 යි　　　තැපැල් ගාස්තුව : ශත 60 යි

## 1983 අංක 49 දරන දුම්රිය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 13 වන දින.]

එල්.ඩී.—ඕ. 9/82.

**දුම්රිය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1983 අංක 49 දරන දුම්රිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) දුම්රිය ආඥාපනතේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 2අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— *2අ අලුත් වගන්තිය 200 වන අධිකාරයෙහි ඇතුළත් කිරීම.*

*'මේ ආඥාපනතෙහි හෝ යම් ලිඛිත නීති යනාදියෙහි ලංකාණ්ඩුවේ දුම්රිය සේවය, ල. දු. සේ. සහ ලංකා දුම්රිය සේවය යන යෙදුම්, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ශ්‍රී. ලං. දු. සේ. සහ ශ්‍රී ලංකා දුම්රිය සේවය යනුවෙන් වෙනස් කිරීම.*

2අ. මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයෙහි සහ ඉන් පසුව—

(1) මේ ආඥාපනතෙහි හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ නිකුත් කරන ලද, සාදන ලද, නියම කරන ලද නැතහොත් අවසර දෙන ලද යම් ඇන්විමක, පණිවුඩයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනයක, "ලංකාණ්ඩුවේ දුම්රිය සේවය" යන යෙදුම හෝ "ල. දු. සේ." යන එහි සංක්ෂිප්ත ස්වරූපය හෝ "ලංකා දුම්රිය සේවය" යන යෙදුම හෝ යෙදී ඇති සෑම අවස්ථාවකම ඒ වෙනුවට අවස්ථාවෝචිත පරිදි "ශ්‍රී ලංකා දුම්රිය සේවය" යන යෙදුම හෝ "ශ්‍රී. ලං. දු. සේ." යන එහි සංක්ෂිප්ත ස්වරූපය හෝ "ශ්‍රී ලංකා දුම්රිය සේවය" යන යෙදුම හෝ ආදේශ විය යුතු ය;

(2) (මෙහි මින් මතු "නිල ලාංඡනය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී. ලං. දු. සේ" යන අකුරු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් හෝ එය ඉංග්‍රීසි භාෂාවෙන් සහ එහි සමානාර්ථය සිංහල සහ දෙමළ භාෂාවලින් හෝ එහි සමානාර්ථය සිංහල සහ දෙමළ භාෂාවලින් පමණක් හෝ දැක්වෙන්නා වූ, යම් භාණ්ඩයක් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දේපළක් ලෙස පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය; තවද

(3) මේ වගන්තිය ක්‍රියාත්මකවීමේ දිනයට පෙර නිල ලාංඡනය ලෙස පැවති "ලං. දු. සේ." යන අකුරු දරන යම් භාණ්ඩයක්, සියලු කාර්ය සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දේපළ ලෙස පූර්ව නිගමනය කරනු ලැබිය යුතුය.'.

ඡ 073193 — 10,600 (83/10)

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියෙහි “වරදකට වරදකරු වන අතර” යන වචනවල සිට “එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය” යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට “වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් තුන් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

31අ, 31ආ, 31ඇ සහ 31ඈ යන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

4. 31 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ම, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියෙහි 31අ, 31ආ, 31ඇ සහ 31ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

“ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දේපළ මත නීත්‍යානුකූල නොවන ආකාරයට නිල ලාංඡනය තැබීම සම්බන්ධයෙන් දණ්ඩනය.

31අ. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දේපළක් වන යම් භාණ්ඩයක් මත, නීත්‍යානුකූල බලයක් නොමැතිව නිල ලාංඡනය තබන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, රුපියල් දෙදහසක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

ශ්‍රී ලංකා දුම්රිය සේවයට අයත් යම් භාණ්ඩයක් වසන් කිරීමේ චේතනාවෙන් නිල ලාංඡනය වෙනස් කිරීම, විරූප කිරීම හෝ මකා හැරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

31ආ. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දේපළක් වන යම් භාණ්ඩයක් වසන් කිරීමේ චේතනාවෙන් එහි නිල ලාංඡනය වෙනස් කරන්නා වූ, විරූප කරන්නා වූ හෝ මකා හරින්නා වූ නැතහොත් වෙනත් යම් ආකාරයකට එම භාණ්ඩයේ නිල ලාංඡනය නොපෙනී යාමට සලස්වන්නා වූ යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද රුපියල් දෙදහසක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

නිල ලාංඡනය දරන යම් භාණ්ඩයක් නීත්‍යානුකූල හේතුවක් නොමැතිව ලබා ගැනීම, සන්තකයෙහි ඇරීම නැත හොත් තබා ගැනීම, විකිණීම හෝ බාර දීම සම්බන්ධයෙන් දණ්ඩනය.

31ඇ. නිල ලාංඡනය දරන යම් භාණ්ඩයක් නීත්‍යානුකූල හේතුවක් නොමැතිව ලබාගන්නා වූ ද සන්තකය දරන්නා වූ හෝ තබා ගන්නා වූ ද, විකුණන්නා වූ හෝ බාර දෙන්නා වූ ද යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු, වරදකරු කරනු ලැබූ විට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද රුපියල් දෙදහසක් නොඉක්ම වන්නා වූ දඩයකට හෝ එක් අවුරුද්දක් නො ඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

යම් තැනැත්තෙක් භාණ්ඩයක් තම ප්‍රයෝජනය නැතහොත් ප්‍රතිලාභය පිණිස හෝ වෙනත් තැනැත්තකුගේ ප්‍රයෝජනය නැතහොත් ප්‍රතිලාභය පිණිස. වෙනත් යම් තැනැත්තකුගේ නියත සන්තකයෙහි නැතහොත් භාරයෙහි හෝ තමා පදිංචිව සිටින හෝ නොසිටින යම් ගොඩ නැගිල්ලක හෝ ස්ථානයක හෝ දැනුවත් ව තබා තිබේ නම්, මේ වගන්තියේ කාර්ය සඳහා ඒ භාණ්ඩය ඒ තැනැත්තාගේ සන්තකයෙහි නැතහොත් භාරයෙහි ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාගේ හෝ බලයලත් නිලධරයකුගේ සහතිකය දේපලෙහි අයිතිය පිළිබඳ සාක්ෂ්‍යය විය යුතු බව.

31ඈ. නිල ලාංඡනය දරන දේපළක් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දේපළක් ද නැද්ද යන්න, ප්‍රශ්නය බවට පත්ව ඇති යම් නඩු පැවරීමක දී, සාමාන්‍යාධිකාරිවරයාගේ හෝ, ඔහු විසින් ඒ සඳහා ලියවිල්ලකින් විශේෂයෙන් බලය දෙන ලද වෙනත් නිලධරයකුගේ හෝ අත්සන යටතේ වූ සහතිකයක් ඒ දේපළ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දේපළක් බවට මුල් බැල්මට පෙනෙන සාක්ෂ්‍යය විය යුතු ය.".